# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2457/35 – 2025 ඔක්තෝබර් මස 10 වැනි සිකුරාදා – 2025.10.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2023/137.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

අංක 2446/40 දරන හා 2025.07.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් පානදුර, තන්තිරිමුල්ල, කෝන්ගහ කොටුව, "චන්දි සෙවණ", අංක 385/5 හි පදිංචි ඒ.එම්.ආර්.සී. අත්තනායක මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බණ්ඩාරගම, කිදෙල්පිටිය, හිරණ තොටුපල පාර, අළුබෝගහවත්තෙ හි පිහිටි රිච් කලර් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 44/2024 දරන හා 2025.06.18 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් රිච් කලර් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 44/2024 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2026.07.21 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 045559 – 10 (2025/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය: රිච් කලර් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අළුබෝගහවත්ත,
හිරණ තොටුපල පාර,
කිදෙල්පිටිය,
බණ්ඩාරගම.

දිනය: 2025.09.08

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2025.07.22 දිනැති අංක 2446/40 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, ඒ.එම්.ආර්.සී. අත්තනායක සහ රිච් කලර් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් බැඳී සිටින්නාවූ ද A/44/2024, 2025.06.18 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන - Rich Colour Exports (Pvt) Ltd.
General Manager - HR,Admin And Compliance
M.H.U. බණ්ඩාරසිංහ

පිටපත: (අනෙක් පාර්ශ්වය)

ඒ.එම්.ආර්.සී. අත්තනායක, අංක 385/5, "චන්දි සෙවණ", කෝන්ගහ කොටුව, තන්තිරිමුල්ල, පානදුර.

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න.)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 10 – 0113

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.